සවියෙන් පෙරට අපි එකට

e- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
| --- | --- | --- | --- |
| 10 | පුරවැසි අධ්‍යාපනය | 2 | 3. බහු සංස්කෘතික සමාජය |



සැකසුම :- පී.වී.බී.එන්. විතාන
බප/හො/ දිවලකඩ ක.වි.

# බහු සංස්කෘතිය සමාජය

වර්තමාන සමාජයේ *විවිධ ජන වර්ග, විවිධ භාෂා, විවිධ ආගම්, ඇදහිලි, සිරිත් විරිත්* වැනි වෙනස්කම් වලින් යුක්ත වේ. මෙවැනි විවිධතා සහිත සමාජ ක්‍රම **බහුවිධ සමාජ** ලෙස හැඳින්වේ.

බහුවිධ සමාජයන්හි ජීවත්වන විවිධ ජන කොටස් තම අනන්‍යතාව ආරක්ෂා කර ගැනීම උදෙසා ඔවුනටම විශේෂිත වූ *සිරිත් විරිත්, භාෂා, ආගම්, ඇදහිලි, සිතුම් පැතුම්, සම්ප්‍රදායන්, පුරුදු පුහුණු* පවත්වාගෙන යති. මේ නිසා එක රටක වුවත් එහි සංස්කෘතිය බහුවිධතාවකින් යුක්ත විය හැකිය. එවැනි සංස්තෘතීන්ගෙන් යුක්ත සමාජය “**බහු සංස්කෘතික සමාජය**” ලෙස හඳුන්වනු ලැබේ.

# සංස්කෘතිය යනු....?

දැනුම, ඇදහිලි, කලා, නීති, සිරිත්විරිත්, ඇගයීම් හා මිනිසා විසින් සමාජයේ ජීවත්වන පුද්ගලයකු වශයෙන් ලබා ගන්නා වූ පුරුදු, ඇබ්බැහිකම් හා හැකියාවන්ගේ සමස්තය සංස්කෘතිය යි.

— ඊ.බී. ටයිලර් —

සංකේතානුසාරයෙන් සමාජීය ලෙස හිමිකොට ගන්නා වූ ද පාරම්පරික වශයෙන් අත්පත් කොට ගත්තා වූ ද සියලු ම චර්යා රටාවන්ට දිය හැකි සාමූහික නාමය සංස්කෘතිය යි.

— චාර්ලිස් ඒ. එල්වුඩ් —

ඇදහිලි, චින්තන ක්‍රම, ව්‍යවහාරික කලා, ජීවන පිළිවෙත්, සිරිත්විරිත්, සම්ප්‍රදායන් හා සමාජීය වශයෙන් "සම්මත කරගත් ක්‍රියා කිරීමේ විධි" සංස්කෘතිය යි.

— ර්. ඊ. හීලර් —








# සංස්කෘතියක අංග ලක්ෂණ....

- ආගම
- භාෂාව
- දැනුම
- ඇඳුම් -පැළඳුම්
- ආහාරපාන
- කලාව
- නීතිරීති
- ඇදහිලි

- සිරිත් විරිත්
- ආචාර ධර්ම
- ඇගයීම්
- පවුල් පසුබිම
- ආර්ථික පසුබිම
- විශ්වාස
- භාවිතා කරන උපකරණ

- ඇසුරු කරන මිතුරන්
- අධ්‍යාපනය
- දේශපාලනය
- තාක්ෂණය
- ජීවත් වන ප්‍රදේශය
- යටිතල පහසුකම්

# බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ....


විවිධ ජනවර්ග, විවිධ ආගමික විශ්වාස දරන විවිධ භාෂා කතා කරන පුද්ගලයින් එකට ජීවත් වීම.

ඉහත විවිධත්වය නිසා ඇති වී තිබෙන ඒ ඒ සංස්කෘතීන්ට ආවේණික සිරිත්විරිත්, ආචාර ධර්ම හා ඇගයීම් පද්ධතියක් ඇවතීම.

එක ජන කොටසක වුව ද ප්‍රාදේශීය ව විවිධත්වයක් දැකිය හැකි වීම.

වර්තමානය වන විට ලෝකයේ රටවල් ජාතීන් වශයෙන් තම දේශ සීමාවලින් ඔබ්බට ගොස් විවිධ ජාතීන් සමඟ සම්මිශ්‍ර වී බහු සංස්කෘතික සමාජ ගොඩනැඟීම.

ගෝලීයකරණය, සන්නිවේදන තාක්ෂණයේ දියුණුව හා සංචාරක ව්‍යාපාරය දියුණු වීම හේතුවෙන් ලෝකයම එකම විශ්ව ගම්මානයක් බවට පත් වී සංස්කෘතික සම්මිශ්‍රණය වීම ඉතා වේගයෙන් සිදු වීම.






| ආගම | ජන සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| බෞද්ධ | 14,222,844 | 70.2% |
| හින්දු | 2,554,606 | 12.6% |
| ඉස්ලාම් | 1,967,227 | 9.7% |
| ක්‍රිස්තියානි | 1,509,606 | 7.4% |
| වෙනත් | 9,440 | 0.1% |

වගු අංක 3.2
මූලාශ්‍රය: ජන සංගණනය 2012
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

| ජන වර්ගය | ජන සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| සිංහල | 15,173,820 | 74.9% |
| ශ්‍රී ලංකා දෙමළ | 2,270,924 | 11.2% |
| ඉන්දියානු දෙමළ | 842,323 | 4.1% |
| ශ්‍රී ලංකා යෝනක | 1,869,820 | 9.2% |
| වෙනත් | 106,836 | 0.5% |

වගු අංක 3.1
මූලාශ්‍රය: ජන සංගණනය 2012
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

# ලෝකයේ බහු සංස්කෘතික රටවල්....

- ශ්‍රී ලංකාව




- ඇමරිකාව



- ඉන්දියාව



- ඕස්ට්‍රේලියාව



# ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සාධක....

- පිහිටීම
- සංක්‍රමණ
- ආක්‍රමණ
- විවිධ ජාතීන් වෙළදාම සඳහා පැමිණීම
- ශ්‍රමිකයන් ගෙන්වා ගැනීම

# පිහිටීම...

- භූගෝලීය පිහිටීම.
- ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම.
- ඉන්දියාවට ආසන්නව පිහිටීම.
- පෙර අපර දෙදිග වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස පිහිටීම



# සංක්‍රමණ...

- විජය ඇතුළු පිරිස පැමිණීම.
- විජයගේ අභිෂේකය සඳහා ගෙන් වූ කුමරිය ඇතුළු පිරිස පැමිණීම.
- පඬුවස්දෙව් ඇතුළු පිරිස පැමිණීම.
- භද්දකච්චායනා ඇතුළු පිරිස පැමිණීම.
- මිහිඳු මහරහතන් වහන්සේ ඇතුළු පිරිස පැමිණීම.
- සංඝමිත්තා තෙරණිය ඇතුළු පිරිස පැමිණීම.
- සංචාරක කටයුතු, රැකියා, අධ්‍යාපනය වැනි විවිධ හේතු මත වර්තමානයේ දී රටකින් රටකට සංක්‍රමණය වීම සිදු වේ.












# ආක්‍රමණ...

- සේන ගුත්තික ආක්‍රමණය
- පණ්ඩු පාරින්ද ආක්‍රමණය
- කාලිංඝ මාඝ ආක්‍රමණය
- බටහිර යුරෝපා ජාතීන්ගේආක්‍රමණය






# විවිධ ජාතීන් වෙළඳාම සඳහා පැමිණීම...

- අරාබි ජාතිකයින්
- ඉන්දියානුවන්
- චීන ජාතිකයින්
- යුරෝපා ජාතීන්









# ශ්‍රමිකයන් ගෙන්වා ගැනීම

- ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමයේ ආර්ථික බෝග වගාවන් සඳහා ශ්‍රමිකයන් වශයෙන් දකුණු ඉන්දීය ද්‍රවිඩ ජනයා ගෙන්වා ගැනීම නිසා එම ජනතාවගේ උරුම හා අනන්‍යතාව ද ශ්‍රී ලංකාවේ සංස්කෘතික විවිධත්වය ඇති වීමට හේතු වී තිබේ.

බහු සංස්කෘතික ජන සමාජයක පැවැත්ම සඳහා යහපාලනයක අවශ්‍යතාව.....

# • යහපාලනය යනු....

**" කිසියම් රටක බලධාරීන් පාලනකරණය සඳහා යොදාගනු ලබන ආයතන හා සම්ප්‍රදායන් යහපත් ඒවා වීමයි"**

එම සම්ප්‍රදායන් නම්,

(1). ආණ්ඩුවක් තෝරා පත් කරගන්නා ආකාරය

(2). ආණ්ඩුවක් කටයුතු කරන ආකාරය

(3). ආණ්ඩුවක් වෙනස් කළ යුතු ආකාරය

(4). ප්‍රතිපත්ති කාර්යක්ෂමව සකසා ගැනීමට සහ ක්‍රියාත්මක කිරීම ආණ්ඩුවට ඇති හැකියාව

ආදී කරුණු යහපත් ලෙස ඉටු කිරීමයි.

“යහපාලනය රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියකි. එහිදී ජනතා සුබසිද්ධිය උපරිම වන අයුරින් පුරවැසි අයිතිවාසිකම් හා සමාජ සාධාරණත්වය සුරැකෙන පරිදි නීතිගරුකව, විනිවිදභාවයෙන්, වංචා හා දූෂණයෙන් තොරව වගවීමෙන් යුක්තව කටයුතු කිරීමේ පාලකයින්ගේ වගකීමකි”.

# යහපාලනය බිඳ වැටීමට හේතු.

- අනවශ්‍ය ආකාරයෙන් බලය මධ්‍යගත වීම.
- රාජ්‍ය පාලනයේ අකාර්යක්ෂමභාවය.
- රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීම.
- නිළධාරිවාදය.
- රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීම හා ක්‍රියාවට නැංවීම කෙරෙහි ජනතා සහභාගිත්වය නොමැති වීම.
- අල්ලස් හා දූෂණය ඉහළ යාම.
- රාජ්‍ය පාලකයින් වගකීමෙන් තොරවීම.
- පෞද්ගලික අංශය ජාතික අභිලාශ නොතකා හැරීම.

# යහපාලනයක මූලික ගුණාංග..

දූෂණයෙන්, වංචාවෙන් තොර රාජ්‍ය පාලනය හා පරිපාලනය.

නිදහස හා සාධාරණත්වය තහවුරු කිරීම.

නීතියේ ආධිපත්‍යයට ගරු කිරීම හා අධිකරණයේ  ස්වාධීනත්වය ආරක්ෂා කිරීම.

රාජ්‍ය පාලන බලතල ක්‍රියාවට නංවන පුද්ගලයින් ජනතාවට වගකීමට බැඳී සිටීම.

අයිතිවාසිකම් සුරැකීම හා තහවුරු කිරීම.

මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම.

සම්පත් කාර්යක්ෂම ව හා ඵලදායී අයුරින් භාවිතයට ගැනීම.

විනිවිද භාවයකින් යුතු ව කටයුතු කිරීම.

ගුණාත්මක දේශපාලන සමාජානුයෝජනයට අවශ්‍ය පසුබිම සකස් කිරීම.

ව්‍යවස්ථානුකූලවාදය ආරක්ෂා කිරීම හා රැක ගැනීම.

# යහපාලනයක් සඳහා එකිනෙකාගේ දේශපාලන, සමාජ, ආර්ථික හා සංස්කෘතික අනන්‍යතාවට ගරු කිරීමේ වැදගත්කම...

# දේශපාලන

- එකිනෙකාගේ දේශපාලන අනන්‍යතාවට ගරු කිරීම.
- තමන් කැමති දේශපාලන මතවාදයක් දැරීම.
- දේශපාලන නායකත්වයට ගරු කිරීම.
- දේශපාලන තීන්දු, තීරණ ගැනීමේදී ස්වාධීනව කටයුතු කිරීම.
- එම තීරණ අන්‍යයන්ට බාධාකාරී නොවීම.
- නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම.

# ආර්ථික

- තමන් කැමති නීත්‍යානුකූල වෘත්තියක හෝ ව්‍යාපාරයක නිරත වීම.
- වෘත්තීය සමිති පිහිටුවා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.
- ආදායම් බෙදී යාමේ විෂමතාව අවම කිරීමට පියවර ගැනීම.
- යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

# සමාජ හා සංස්කෘතික

- කැමති ආගමක් ඇදහීම
- සිරිත් විරිත් අනුගමනය කිරීම
- විවිධ උත්සව පැවැත්වීම
- කැමති ප්‍රදේශයක පදිංචි වීම
- විවිධ භාෂාවන් ඉගෙනීම හා භාවිතය
- නිදහසේ ගමනාගමනය
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම

# බහු සංස්කෘතික ජන සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන්,

- ජන වර්ග හා විවිධ ජන කණ්ඩායම් අතර විශ්වාසය තහවුරු වේ.
- එකිනෙකා අතර අවබෝධය පුළුල් වේ.
- පාලන කටයුතු සඳහා සියලු ජනවර්ග හා ජන කණ්ඩායම් වල සහභාගිත්වය වර්ධනය වේ.
- එකිනෙකාට ගරු කිරීමට හුරු වේ.
- ආගමික හා සංස්කෘතික විවිධතා නොසලකා සහජීවනයෙන් කටයුතු කරයි.
- නීතිගරුක පුරවැසියන් ලෙස ජීවත්වීමට පුරුදු වේ.
- විනිවිදභාවයෙන් කටයුතු කරයි.

# බහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග....

- එකිනෙකාගේ සංස්කෘතීන් හඳුනා ගැනීම හා අවබෝධයෙන් යුතු ව කටයුතු කිරීම, එකිනෙකාට ගරු කිරීම
- අන්‍ය ආගම්වලට අවමන් නොකිරීම
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම
- ගැටුම් ඇති නොවන සේ කටයුතු කිරීම
- සාමූහිකත්වය වර්ධනය කිරීම
- එක්සත් ව කටයුතු කිරීමෙන් ජයග්‍රහණය ලබා ගැනීම පහසු බව අවබෝධ කර ගැනීම
- අනෙකුත් ජනවර්ගවල භාෂාවන් ඉගෙනීම හා භාවිතය
- සර්ව ආගමික වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
- අන්‍ය මත ඉවසීම හා ඒවාට ගරු කිරීම
- සමානාත්මතාවය

# බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන්,

- ජාතික සමගිය හා සහජීවනය වර්ධනය වේ
- ගැටුම් අවම වේ
- අන්‍යෝන්‍ය සුහදත්වය හා විශ්වාසය වර්ධනය වේ
- එක් ජාතියක්, එක් රටක් යන හැඟීම වර්ධනය වේ
- මිනිස් නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වේ
- රටේ සංවර්ධනය වෙනුවෙන් සෑම පුරවැසියෙකු ම නොපිරිහෙලා කටයුතු කිරීම හා එය ජාතික යුතුකමක් සේ සලකා කටයුතු කිරීමට පෙළඹේ
- අන්‍ය ආගම් හා සංස්කෘතීන්ට අගරු නොවන ආකාරයට හැසිරීමට හුරු වේ.

බහු සංස්කෘතික සමාජයක සහජීවනයෙන් කටයුතු කිරීමෙන් ජයග්‍රහණ ලබා ගැනීම පහසු වේ. සාමය, සුරක්ෂිතතාව, සාධාරණ බව, රටවැසියන් සියලු දෙනාට ම එක සේ හිමිවිය යුතු ය. සියලු දෙනාම එක් ව සතුටින් ජීවත් වීමට නම්, එක්සත් - ශක්තිමත් දේශයක් අප එක්ව ගොඩනැඟිය යුතු ය. ඒ සඳහා කැපවීම අපේ වගකීමයි.

සවියෙන් පෙරට අපි එකට

*e*- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 10 | පුරවැසි අධ්‍යාපනය | 2 | 3. බහු සංස්කෘතික සමාජය - ඇගයීම |

**සැකසුම :- පී.වී.බී.එන්. විතාන**

**බප/හො/ දිවලකඩ ක.වි.**

**සුදුසු පිළිතුර තෝරන්න.**

01. එක් සමාජයක් තුළ විවිධ සංස්කෘතීන්ට අයත් ජන කොටස් සාමූහිකව ජීවත් වන්නේ නම්, එම සමාජය හඳුන්වන්නේ,

1.බහු ආගමික සමාජයක් ලෙසය. 2. බහු සංස්කෘතික සමාජයක් ලෙසය.

3. බහු වාර්ගික සමාජයක් ලෙසය. 4. බහු ජාතික සමාජයක් ලෙසය.

02. බහු සංස්කෘතික ජන සමාජයක අනාගත පුරවැසියන් තුළ සංහිඳියාව ඇති කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ඵලදායීම ක්‍රියාමාර්ගය වන්නේ,

1.අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීමය.

2.විවිධ ජන කණ්ඩායම් මිශ්‍ර වූ පාසල් ඇති කිරීමයි.

3.අන්‍ය භාෂාවන් ඉගෙනීමට උනන්දු කිරීමය.

4.සංස්කෘතික විවිධත්වයක් ඇති කිරීමයි.

03. සංක්‍රමණ ස්වරූපයෙන් පැමිණ ශ්‍රී ලංකාවේ ජනාවාස පිහිටුවන ලද අවස්ථාවක් වන්නේ,

1.අරාබි ජාතිකයන්ගේ පැමිණීම.

2.පඬුවස්දෙව් ඇතුළු පිරිස පැමිණීම.

3.කාලිංග මාඝ ආක්‍රමණය.

4.ශ්‍රමිකයන් ගෙන්වා ගැනීම.

04. යහපාලනයක් සහිත රටක මූලික ගුණාංගයක් නොවන්නේ මින් කුමක් ද?

1.නිදහස හා සාධාරණත්වය තහවුරු කිරීම.

2.අයිතිවාසිකම් සුරැකීම හා තහවුරු කිරීම.

3.මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම.

4.පාඩු ලබන ආයතන පෞද්ගලීකරණය කිරීම.

05. බහු සංස්කෘතික සමාජයක පුරවැසියකුගේ වගකීම වන්නේ,

1.තමන්ගේ සංස්කෘතිය ඉස්මතු වන සේ කටයුතු කිරීම ය.

2.සියලු ම සංස්කෘතීන්ට ගරු කරමින් සමානව සැලකීම ය.

3.වැඩි පිරිසක් අයත්වන සංස්කෘතියට අනුගත ව කටයුතු කිරීම ය.

4.විවිධ සංස්කෘතීන් මිශ්‍ර වීම වැළැක්වීමට කටයුතු කිරීම ය.

06. බහු සංස්කෘතික සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන් අත්වන වැදගත් ප්‍රතිඵලයකි.

1.එකිනෙකාට ගරු කිරීමට පුරුදු වීම.

2.රාජ්‍ය භාෂා කිහිපයක් භාවිතා කළ හැකි වීම.

3.විවිධ සංස්කෘතීන් පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි වීම.

4.ජන වර්ග හා විවිධ ජන කණ්ඩායම් අතර විශ්වාසය තහවුරු වීම.

07. බහු සංස්කෘතික සමාජයක යහ පැවැත්මට බාධාකාරී වන ලක්ෂණයක් වන්නේ,

1.අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීමය.

2.සෑම විටම අන්‍ය සංස්කෘතීන්ට වඩා තම සංස්කෘතිය උසස් බව සලකා කටයුතු කිරීමය.

3.ජාති, ආගම් භේද නොසලකා කටයුතු කිරීමය.

4.අන්‍ය ජාතීන්ගේ භාෂා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමය.

08. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීමට බලපෑ භූගෝලීය සාධකයක් වන්නේ,

1.දකුණු ආසියාතික රටක් වීම ය.

2.ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම ය.

3.සංචාරකයන්ට යෝග්‍ය වෙරළ තීරයක් පිහිටා තිබීම ය.

4.ත්‍රිකුණාමලයේ ස්වභාවික වරායක් පිහිටා තිබීම ය.

09. ශ්‍රී ලංකාවේ 2012 ජන සංගණනයට අනුව සිංහල ජනගහනය ප්‍රතිශතයක් ලෙස,

| | |
|---|---|
| 1. 4.1% | 2. 9.2% |
| 3. 74.9% | 4. 11.2% |

10. සංස්කෘතිය යනු ඇදහිලි, චින්තන ක්‍රම, ව්‍යවහාරික කලා, ජීවන පිළිවෙත්, සිරිත්විරිත්, සම්ප්‍රදායන් හා සමාජීය වශයෙන් **"සම්මත කරගත් ක්‍රියා කිරීමේ විධි"** ලෙස හැඳින්වූයේ,

| | |
|---|---|
| 1.ටී.බී. ටයිලර්. | 2.ඊ.ටී. හීලර්. |
| 3.චාර්ල්ස් ඒ. එල්වුඩ් | 4.ඒ.වී. ඩයිසි. |

**සියලුම ප්‍රශ්න සඳහා පිලිතුරු සපයන්න.**

01. බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ දෙකක් ලියන්න.
02. සංස්කෘතිය පිළිබඳ නිර්වචන ඉදිරිපත්කර ඇති දාර්ශනිකයන් දෙදෙනෙක් නම් කරන්න.
03. බහු සංස්කෘතික සමාජයක් තුළ ගැටුම් අවම කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.
04. බහු සංස්කෘතික සමාජයක් බිහිවීම කෙරෙහි බලපාන සාධක තුනක් ලියන්න.
05. බහු සංස්කෘතික සමාජයක පැවැත්ම සඳහා යහපාලනයක් තුළ තිබිය යුතු ගුණාංග තුනක් ලියන්න.

**සවියෙන් පෙරට අපි එකට**

***e*- ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 10 | පුරවැසි අධ්‍යාපනය | 2 | 3. බහු සංස්කෘතික සමාජය - පිළිතුරු |

**සැකසුම :- පී.වී.බී.එන්. විතාන**

**බප/හො/ දිවලකඩ ක.වි.**

**I කොටස**

| | | | | |
|---|---|---|---|---|
| 1) 2 | 2) 2 | 3) 2 | 4) 4 | 5) 2 |
| 6) 4 | 7) 2 | 8) 2 | 9) 3 | 10) 2 |

**II කොටස**

01.

- විවිධ ජනවර්ග, විවිධ ආගමික විශ්වාස දරන විවිධ භාෂා කතා කරන පුද්ගලයින් එකට ජීවත් වීම.
- ඉහත විවිධත්වය නිසා ඇති වී තිබෙන ඒ ඒ සංස්කෘතීන්ට ආවේණික සිරිත්විරිත්, ආචාර ධර්ම හා ඇගයීම් පද්ධතියක් පැවතීම.
- එක ජන කොටසක වුව ද ප්‍රාදේශීය ව විවිධත්වයක් දැකිය හැකි වීම.
- වර්තමානය වන විට ලෝකයේ රටවල් ජාතීන් වශයෙන් තම දේශ සීමාවලින් ඔබ්බට ගොස් විවිධ ජාතීන් සමඟ සම්මිශ්‍ර වී බහු සංස්කෘතික සමාජ ගොඩනැඟීම.
- ගෝලීයකරණය, සන්නිවේදන තාක්ෂණයේ දියුණුව හා සංචාරක ව්‍යාපාරය දියුණු වීම හේතුවෙන් ලෝකයම එකම විශ්ව ගම්මානයක් බවට පත් වී සංස්කෘතික සම්මිශ්‍රණය වීම ඉතා වේගයෙන් සිදු වීම.

02.

- ටී.බී. ටයිලර්
- චාර්ලිසි ඒ. එල්වුඩ්
- ර්. ටී. හීලර්

03.

- එකිනෙකාගේ සංස්කෘතීන් හඳුනා ගැනීම හා අවබෝධයෙන් යුතු ව කටයුතු කිරීම, එකිනෙකාට ගරු කිරීම.
- අන්‍ය ආගම්වලට අවමන් නොකිරීම.
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම.
- ගැටුම් ඇති නොවන සේ කටයුතු කිරීම.
- සාමූහිකත්වය වර්ධනය කිරීම.
- එක්සත් ව කටයුතු කිරීමෙන් ජයග්‍රහණය ලබා ගැනීම පහසු බව අවබෝධ කර ගැනීම.
- අනෙකුත් ජනවර්ගවල භාෂාවන් ඉගෙනීම හා භාවිතය.
- සර්ව ආගමික වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- අන්‍ය මත ඉවසීම හා ඒවාට ගරු කිරීම.
- සමානාත්මතාවය.

04.

- පිහිටීම
- සංක්‍රමණ
- ආක්‍රමණ
- විවිධ ජාතීන් වෙළඳාම සඳහා පැමිණීම
- ශ්‍රමිකයන් ගෙන්වා ගැනීම

05.

- දූෂණයෙන්, වංචාවෙන් තොර රාජ්‍ය පාලනය හා පරිපාලනය.
- නිදහස හා සාධාරණත්වය තහවුරු කිරීම.
- නීතියේ ආධිපත්‍යයට ගරු කිරීම හා අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම.
- රාජ්‍ය පාලන බලතල ක්‍රියාවට නංවන පුද්ගලයින් ජනතාවට වගකීමට බැඳී සිටීම.
- අයිතිවාසිකම් සුරැකීම හා තහවුරු කිරීම.
- මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම.
- සම්පත් කාර්යක්ෂම ව හා ඵලදායී අයුරින් භාවිතයට ගැනීම.
- විනිවිද භාවයකින් යුතු ව කටයුතු කිරීම.